**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විද්‍යාපීඨ 4 ක සමාලෝචිත වර්ෂය අවසානය වන විට පියවා නොතිබූ අත්තිකාරම්වල වටිනාකම රු. 2,310,757 ක් වූ අතර, ඉන් එක් විද්‍යාපීඨයකින් පමණක් රු. 2,006,394 ක ශේෂයක් පැවතුණි. | නියමිත කාර්යය නිමවූ විගස අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළයුතු වීම. | ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දී ඇති බව. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාල 2 වන ව්‍යවස්ථාව | අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අයිතිය අමාත්‍යාංශය වෙත පවරා තිබූ නමුත්, ඒ අනුව පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර, අමාත්‍යාංශය මගින් ඒවා අධීක්ෂණය හා කළමනාකරණය කළයුතු වීම. | කටයුතු කරමින් පවතින බව. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| i. 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්ති මූලධර්මවලට අනුව, මහජන සේවා අවශ්‍යතා සහ ආයතනය සතු ධාරිතාවය සැලකිල්ලට ගනිමින් සේවා ප්‍රමිතීන් නියම කිරීම, මහජනතාවට නිවැරදි කරුණු හා තොරතුරු විවෘතව සැපයීමට සහතික වීම හා සියල්ලන්ට ආචාරශීලිව, මිත්‍රශීලිව හා සාධාරණව සැලකීම මෙන්ම වරදක් සිදුවූ විට නිවැරදි කිරීම ප්‍රමාණවත් අයුරින් සිදුකර නොතිබුණි. | මහජන අවශ්‍යතා කඩිනමින් හා විශ්වාසදායක අන්දමින් ඉටුකිරීමට නිවැරදි විසඳුම් ලබාදීමට කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී කටයුතු කරන බව . |

| | | | |
|---|---|---|---|
| ii. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵල ලබා කරගැනීම සඳහා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය යොදවනු ලබන ආකාරය පිළිබඳ, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හා එක් එක් නිලධාරී තලය අනුව හඳුනාගත් නිපුණතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සුදුසු ධාරිතා සංවර්ධන වැඩසටහන් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම ඵලදායී ලෙස ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව සම්පත් හඳුනාගැනීමට හා ඔවුන්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීමට කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. |
| (ඇ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශයේ විවිධ තනතුරුවල සේවයේ නියතු නිලධාරීන් 242 දෙනෙකු ස්ථානමාරු නොලබා වර්ෂ 6 ක සිට වර්ෂ 20ක් දක්වා සේවා කාලයක් සේවය කරන බව අනාවරණය විය. | නියමිත සේවා කාල සීමාවන් තුල විධිමත් ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වීම. | විධිමත් ස්ථාන මාරු ක්‍රමයට අනුව ඉදිරියේදී කටයුතු කරන බව. |
| **(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ** ---------------------- | | | |
| i. 1964 නොවැම්බර් 20 දිනැති අංක 1964/27 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය සහ 1996 ජුනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් ලිපිය | 2019 දෙසැම්බර් 31 දිනට ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා වශයෙන් විදුහල්පතිවරයා පත් කර නොගත් ජාතික පාසැල් 10 ක් පවතින බව නිරීක්ෂණය විය. | ජාතික පාසැල්වල උන්නතිය වෙනුවෙන් ඇති කරනු ලබන ආදි ශිෂ්‍ය සංගම්වල කටයුතු මෙහෙයවීම සඳහා එම සංගම්වල සභාපතිවරයා වශයෙන් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විදුහල්පතිවරයා පත්කළ යුතු වීම. | ඒ අනුව කටයුතු කිරීමට උපදෙස් දී ඇති බව |

| | | | | |
|---|---|---|---|---|
| ii. | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය හා 2008 ඔක්තෝබර් 28 දිනැති අංක 10/2377/436/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රජයේ පාසැලක වසර 08 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ගුරුවරුන් ස්ථානමාරු කළයුතු වුවත්, නුගේගොඩ අනුලා විද්‍යාලයේ වසර 08 කට වැඩි සේවා කාලයක් සහිත ගුරුවරුන් 33 දෙනෙකුට ස්ථානමාරු ලබාදී නොතිබුණි. | විධිමත්ව ස්ථානමාරු ක්‍රමය ක්‍රියාත්මක කළයුතුය. | නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව |
| iii. | 2008 සැප්තැම්බර් 19 දිනැති 2008/37 දරන චක්‍රලේඛයේ 2.2 (ඈ) ඡේදය | 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක සමාන සමාන්තර පන්ති ගණන පවත්වා ගෙන යායුතු වුවද, විධිමත් අනුමැතියකින් තොරව මහනුවර මහාමයා බාලිකා විද්‍යාලයේ 7 ශ්‍රේණියේ සිට හා හොරණ තක්ෂිලා විද්‍යාලයේ 9 ශ්‍රේණියේ සිට සමාන්තර පන්තියක් වැඩියෙන් පවත්වා ගෙන යමින් තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සමාන්තර පන්ති සංඛ්‍යාවන් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වීම. | අවශ්‍ය පියවර ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇති බව. |
| iv. | 2008 අප්‍රේල් 30 දිනැති අංක 2008/17 දරන චක්‍රලේඛය 4.1 සහ 4.6 වගන්තිය සහ 2013/4 චක්‍රලේඛය 03 (ඉ) වගන්තිය | 2019 වර්ෂයේදී නුගේගොඩ අනුලා විද්‍යාලයේ අ.පො.ස. (උසස් පෙළ) සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව ඉල්ලුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සිසුන් තෝරාගැනීම සහ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමේ කටයුතු සිදුකර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගන්නා ලෙස දැනුවත් කිරීම් කර ඇති බව. |
| v. | 2010 මැයි 31 දිනැති අංක 235/2011 හා 232/2011 දරන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු, 2015 ඔක්තෝබර් 14 | චක්‍රලේඛ ප්‍රකාරව 2019 වර්ෂයේදී පළමුවන ශ්‍රේණියේ එක් පන්තියකට ඇතුළත් කලහැකි සිසුන් ගණන 37 ක් වුවද, මහනුවර මහාමායා බාලිකා | අදාල නඩු තීන්දු, අමාත්‍ය මණ්ඩල තීරණ හා චක්‍රලේඛ ප්‍රකාරව පළමුවන ශ්‍රේණියේ එක් පන්තියක සිටිය යුතු සිසුන් සංඛ්‍යාව පිළිබඳව කටයුතු කළයුතු වීම. | ඒ පිළිබඳ උපදෙස් දී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 15/1490/742/003 2015 දෙසැම්බර් 29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 34/2015 | විදුහලේ සමාන්තර පන්ති පහෙන් තුනකටම සිසුන් 38 බැගින් ඇතුළත් කර තිබුණි. | | |
| vi. 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ජාතික පාසැල් 71 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 148 ක්, ජාතික පාසැල් 26 ක සහකාර විදුහල්පතිවරුන් 52 ක් හා ජාතික පාසැල් 125 ක ගුරුභවතුන් 389 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී කිසිදු ඉගෙනුම් කාර්යයක් පවරා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉගෙනුම් කාල පරිච්ඡේද පැවරිය යුතු වීම. | නියෝජ්‍ය සහ සහකාර විදුහල්පතිවරුන් සඳහා වූ ඉගැන්වීමේ කාල පරිච්ඡේද සම්බන්ධයෙන් ජාතික පාසැල් විදුහල්පතිවරුන් දැනුවත් කර ඇති බව. |
| (ඉ) 2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 අතිවිශේෂ ගැසට් පත්‍රය | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ලැයිස්තුගත ජාතික පාසැල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරු වශයෙන් පත්කර නොතිබුණි. | අදාල නිලධාරීන් පත්කිරීමට කටයුතු කළයුතු වීම. | අදාළ පත්කිරීම් සිදුකිරීමට කටයුතු කරන බව . |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අග්‍රිම ගිණුමෙහි ශේෂය රු. 7,181,553 ක් විය. | වර්ෂය අවසානයට අග්‍රිම ගිණුමේ ශේෂය නිරවුල් කළයුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට මැතිවරණ වියදම් සියල්ල පියවා නොතිබුණු හෙයින් |

ඉතිරි වී ඇති බව.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂය සඳහා වූ පුනරාවර්තන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු. 638,466,966 ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 51 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක පැවතුණි. එක් පුනරාවර්තන වැය විෂයයක රු. 243,500,000 ක මුළු ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි. | වර්ෂය වෙනුවෙන් සැලසුම්ගත පරිදි අරමුණු ඉටු කරගැනීමට ලබාදී ඇති ප්‍රතිපාදන සැකසුරුවම් ලෙස උපයෝජනය කළ යුතු වීම. | මෙම කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. |
| (ආ) 2019 වර්ෂයේ මූලධන වැය විෂයයන් 27 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 11,495,177,410 ක් සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණු අතර, වැය විෂයයන් 45 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු. 10,630,937,570 ක් හෙවත් සියයට 50 ක සිට 99 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) වැය විෂයයන් 3 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබුණු රු. 104,863,653 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | අවශ්‍යතා වෙනුවෙන් ලබාගෙන ඇති පරිපූරක ප්‍රතිපාදන අදාල පරිදි උපයෝජන කිරීමට කටයුතු කළ යුතු වීම. | -එම- |
| (ඈ) සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට අදාළ රු.755,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 601,200,002 ක් ඉතිරිව තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 79.6 ක් විය. | විදේශ ආයෝජනයන් උපරිම ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | ක්‍රියාකාරී සැලැස්ම නියාමනය කිරීම සඳහා අන්තර්ජාලය හරහා ප්‍රගතිය සඳහන් කළ හැකි ආකෘතියක් හඳුන්වා දී ප්‍රගති සමාලෝචන කැඳවමින් ඉදිරියේදී කටයුතු කරන බව. |

## 2.3 රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්‍ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සැසඳුම් ප්‍රකාශය අනුව ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා වෙනත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු. 159,311,292 ක් විය. ඉන් වර්ෂ 5 ක් ඉක්මවූ ශේෂය රු. 68,529,282 ක් වූ අතර, එම අයවිය යුතු ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ හිටි ශේෂ පියවා ගැනීමට හා නොසැසඳීම් හඳුනා නිවැරදි කිරීමට පියවර ගතයුතු වීම. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2019 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන බව. |
| (ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ අවසාන ශේෂය වර්ෂ ගණනාවක සිට නොසැසඳී පැවතුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු. 9,552,600 කින් නොසැසඳුණි. එම ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගිණුම් සැසඳුම් වෙනසක් සහිතව ඉදිරිපත් කර තිබුණු බැවින්, මෙම වෙනස්කම් සිදුව ඇති බව. |
| (ඇ) 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 4 වන ඡේදයට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශ අත්තිකාරම් බී ගිණුමේ මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස රු. 18,899,815 ක් දක්වා තිබුණි. | -එම- | ලිපිගොනුවල පවතින අඩුලුහුඩුකම් හේතුවෙන් එම ණය ශේෂයන් වර්ෂයක් තුළදී නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව. |

## 2.4 තැන්පතු ශේෂ

| විගණන නිරීක්‍ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 2 ඉක්මවූ නමුත්, රාජ්‍ය ආදායමට බැරනොකල ඇප තැන්පත්, ටෙන්ඩර් තැන්පත්, අරමුදල් (මණ්ඩල), තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් සහ කොන්ත්‍රාත් රුඳවුම්වල වටිනාකම රු. 216,504,056 ක් විය. එම ශේෂය තුල වර්ෂ 5 ඉක්මවූ රු. 1,387,539 ක ශේෂයක් ද ඇතුළත් වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂ දෙක ඉකුත් වූ තැන්පත් ශේෂ පිළිබඳව කටයුතු කළයුතු වීම. | තැන්පත් ගිණුම්වල පවතින වසර 02 ඉකුත් වූ ශේෂ නිරවුල් කරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙමින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ විද්‍යාපීඨ වෙත ලිපි නිකුත් කරන බව. |

**2.5** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) හා (ඇ) විධිවිධානවලට පටහැනිව අමාත්‍යාංශයේ 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු. 4,787,728,771 ක බැරකම්ද රු. 5,350,556,597 ක බැඳීම්ද ඇති කරගෙන තිබුණි. එමෙන්ම, වැය විෂයයන් 14 ක ඉතිරිවීම් ඉක්මවා රු. 765,255,768 ක බැරකම්වලට එළඹ තිබුණි. | ප්‍රතිපාදන හා ඉතිරිවීම් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට නොඑළඹීමට කටයුතු කළයුතු වීම. | පෙන්වා දී ඇති නිර්දේශිත කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇති බව. |
| (ආ) ඉකුත් වර්ෂයට අදාළ රු. 464,879,038 ක බැරකම් සමාලෝචිත වර්ෂයේදීද පියවා ගැනීමට අපොහොසත් වී තිබුණි. | -එම- | -එම- |

**2.6** **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අදාළව නිකුත් කරන ලද මාස 06 ක කාලය ඉකුත් වූ රු. 3,250,821 ක් වටිනා චෙක්පත් 25 ක් 2019 දෙසැම්බර් 31 දක්වා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි. | කාලය ඉකුත් වූ චෙක්පත්වලට අදාළව මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ඒ අනුව කටයුතු කරන බව. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **සැලැසුම් කිරිම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය සඳහා සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) 2019 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කරන ලද රු. 12,251,865,000 ක් වටිනා කාර්යයන් 55 කින් කිසිදු කාර්ය සාධනයක් සමාලෝචිත වර්ෂයේදී ලබා කරගෙන නොතිබුණි. | සැලසුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම හා ඒවායේ කාර්යසාධනය | ක්‍රියාකාරී සැලැස්ම නියාමනය කිරීම සඳහා අන්තර්ජාලය හරහා ප්‍රගතිය සඳහන් කළ හැකි ආකෘතියක් හඳුන්වා දී |

| | | |
|---|---|---|
| | ඇගයීමට කටයුතු කළයුතු වීම. | ප්‍රගති සමාලෝචන කැඳවමින් ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ආ) අමාත්‍යාංශයේ ශාඛා අතරින් ශාඛා 12 ක කාර්යසාධනය සියයට 0.97 සිට සියයට 45 දක්වා පරාසයක පැවති අතර, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශාඛාවේ සැලසුම්ගත කාර්යයන් 19 කින් රු. 5,881,000,000 ක් වටිනා කාර්යයන් 5 කින් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | සැලසුම්වල සඳහන් කාර්යයන් නිශ්චිතව ඉටු කිරීම පිළිබඳව නියාමනය, අධීක්‍ෂණය හා පසුවිපරම් කිරීම සිදුකළ යුතු වීම. | -එම- |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්‍ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කලයුතු විය. එසේ වුවද, මෙම කාර්යය සඳහා 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් ආරම්භ කළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත්, 2019 වර්ෂය අවසාන වන විටද නිශ්චිත හා ස්ථිරසාර ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | ශ්‍රී ලාංකීය අධ්‍යාපනය සඳහා නොවෙනස් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කළයුතු වීම. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරමින් පවතින බවත්, ඒ සම්බන්ධයෙන් විද්වත් කමිටුවක් කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 5 ත් අවුරුදු 14 ත් අතර වයස් සීමාවල දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පෞද්ගලික පාසැල් ආරම්භ නොකළ යුතුයි. එසේ වුවද, පනතට පටහැනිව ආරම්භ කර තිබුණු ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් අධීක්‍ෂණය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් වුවත්, ඒ සම්බන්ධ අධීක්‍ෂණයක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. | වර්තමානයේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති පුද්ගලික හා ජාත්‍යන්තර පාසැල් පිළිබඳ විධිමත් අධීක්‍ෂණයක් සහ නියාමනයක් සිදුවිය යුතු වීම. | අදාළ නෛතික විධිවිධාන සංශෝධනය කොට අවශ්‍ය රෙගුලාසි සම්පාදනය කිරීමෙන් අනතුරුව ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් විධිමත් කිරීම සිදුකළ හැකි බව. |
| (ඇ) | අ.පො.ස. උසස් පෙළ 13 වසරේ සිසුන් අඛණ්ඩව පාසැල් අධ්‍යාපනය තුල රඳවා ගැනීම සඳහා පිළියම් යෙදීමට අදාළ සැලසුම් කිසිවක් අමාත්‍යාංශයේ වාර්ෂික සැලසුම්වල ඇතුළත් කර නොතිබුණි. | අ.පො.ස. උසස් පෙළ විභාගය අවසන් වනතුරු සිසුන්ගේ පාසල් පැමිණීම අනිවාර්ය කරමින් පාසල් කාලය තුල සිසුන් පාසැල තුල රඳවා ගැනීමට සැලසුම් සකස් කළ යුතු වීම. | සිසුන් පාසැල වෙත ගෙන්වා ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කරන බව. |
| (ඈ) | 2016 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 5 තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද පාසැල් සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු. මිලියන 700 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. වැඩසටහන සඳහා සැලසුම්ගත කාලය වූ වර්ෂ 5 න් වර්ෂ 4 ක් ගෙවී ගොස් ඒ සඳහා රු. මිලියන 237.74 ක් පමණක් වැයකර ඇතත්, 2019 දෙසැම්බර් 31 දින දක්වාම එය නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. | කායික හා මානසික සමබර අධ්‍යාපන ක්‍රමයක් තුල සියළු සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම අරමුණු කරගත් ක්‍රීඩා වැඩසටහන ඵලදායීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වීම. | 2019-2025 දක්වා ක්‍රීඩා සංවර්ධන වැඩසටහන සඳහා සැලසුමක් සකස් කර කටයුතු කරන බව. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සිසුන් 1,220 ක් ඉගෙනුම ලබන ජාතික පාසැල් 107 ක පවතින විශේෂ අධ්‍යාපන ඒකකයන්ට ගුරුභවතුන් 305 ක් අනුයුක්තව සිටිය යුතු වුවත්, ගුරුභවතුන් 81 ක පුරප්පාඩු පැවතුණි. | විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ඉගැන්වීමට විශේෂිත පුහුණුව ලද ගුරුභවතුන් යෙදවීමට හා ගුරුභවතුන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම. | විශේෂ අධ්‍යාපන පුහුණුව ලබා එම සේවයේ නොයෙදෙන ගුරුභවතුන් අදාළ ක්ෂේත්‍රයේම ස්ථානගත කිරීමට පළාත් බලධාරීන් උපදෙස් ලබාදී ඇති බවත් ගුරු පුරප්පාඩු සඳහා නව ගුරුභවතුන් බඳවා ගැනීමට කටයුතු කරන බව. |
| (ඊ) | ක්‍රීඩා දක්‍ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණු පෙරදැරිව 1989 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසැල් 22 කට පසුගිය වර්ෂ 5 තුලදී ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ඒ හේතුවෙන් එම පාසැල්වල පැවති නේවාසිකාගාර, ක්‍රීඩා උපකරණ හා | ක්‍රීඩා පාසැල් ඵලදායී ලෙස ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වීම. | ක්‍රීඩා සිසුන්ට නියමිත පුරප්පාඩු තබාගැනීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | කාය වර්ධන උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. පසුගිය වසර 5 තුල ක්‍රීඩා ශිෂ්‍යත්වධාරීන් 293 ක් කළමනාකරණ දුර්වලතා, නිසි පුහුණුවක් නොලැබීම හා ක්‍රීඩා පාසල් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම පාසල්වලින් ඉවත් වී තිබුණි. මෙම පාසැල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී ක්‍රීඩා දක්‍ෂතා සහිත සිසුන්ට වෙන්කරන ලද ඉඩද භාවිතා කර තිබීම හේතුවෙන් ක්‍රීඩා ශිෂ්‍යත්වලාභීන් ඇතුළත් කරගැනීමට ඉඩකඩ නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ක්‍රීඩා පාසැල් 22 කින් ක්‍රීඩා කිරීමට සුදුසු ස්ථාන නොමැති පාසැල් 10 ක්,විදුලි අඩුපාඩු සහිත පාසැල් 08 ක්, අවදානම් සහිත නේවාසිකාගාර පවතින පාසැල් 04 ක් හා සනීපාරක්‍ෂණ පහසුකම් අඩු පාසැල් 12 ක් පැවතුණි. | | |
| (උ) | පාසැල් මට්ටමින් ක්‍රීඩා සංවර්ධනය කිරීම,නියාමනය කිරීම සහ පාසැල් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම අරමුණු කරගෙන පිහිටුවා තිබුණු ක්‍රීඩා සභාවේ ක්‍රියාකාරිත්වය වර්තමානය වන විට අක්‍රිය වී තිබුණි. ඒ හේතුවෙන්, පාසැල් ක්‍රීඩා සංගම්වල මූල්‍ය කටයුතු පාලනය සහ අධීක්‍ෂණය, ක්‍රීඩකයින් විදේශ තරඟ සඳහා සහභාගී කරවීමට ප්‍රමාණවත් මැදිහත්වීම, සියළුම ක්‍රීඩා සංගම්වල තරඟ හා ක්‍රීඩා සංගම් වැඩසටහන් පිළිබඳව අධීක්‍ෂණය, නියාමනය හා පාසැල් ක්‍රීඩා සංගම් මඟින් පවත්වනු ලබන අනුමත දේශිය හා විදේශිය තරඟවලට අනුග්‍රාහකත්වය ලබාදීම සඳහා සාධාරණ මැදිහත්වීම ආදී කාරණා සිදුවී නොතිබුණි. | පාසැල් ක්‍රීඩා සංවර්ධනය සඳහා ශක්තිමත් සහයෝගයක් ලබාදීමට හැකි වන අයුරු ක්‍රීඩා සභාව සහ ක්‍රීඩා සංගම් සංවර්ධනය කර පවත්වාගෙන යා යුතු වීම. | තොරතුරු රැස් කරමින් පවතින බැවින්, ඉදිරියේදී කරුණු දක්වන බව. |
| (ඌ) | අධ්‍යාපන ප්‍රමිතීන්ට අනුව ඉගෙනුම් ද්‍රව්‍ය සැපයීම තුලින් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහතික කිරීම වෙනුවෙන් මූලිකව කටයුතු කරන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා හැර අ.පො.ස. උසස් පෙළ විෂය ධාරාවන්ගේ ප්‍රධාන විෂයයන් සඳහා පොත් මුද්‍රණය කර නොතිබුණි. එසේ වුවද, 2016 සිට 2019 වර්ෂය දක්වා (උසස් පෙළ) විෂයයන්ට සම්බන්ධ අතිරේක පොත් 393,500 ක් මුද්‍රණය කර තිබුණු අතර, එම පොත් ඍජුව පාසල් වෙත බෙදා නොහැර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන හරහා පමණක් අලෙවි කර තිබුණි. | අතිරේක අධ්‍යාපන ප්‍රකාශන සියළුම පාසැල් සිසුන්ට බෙදා හැරෙන ක්‍රමයක් ස්ථාපිත කළයුතු වීම. | දෙපාර්තමේන්තු අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවලට අමතරව ලියාපදිංචි පොත් අලෙවි සැල්වල මෙම පොත අලෙවි කරනු ලබන බව. |

## 3.3 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලීය ශිෂ්‍ය නායක මණ්ඩලය නමින් 2016 සිට 2018 දක්වා තැන්පත් කර තිබුණු එකතුව රු. 3,166,067 ක් වූ මුදලක් 2019 සැප්තැම්බර් වන විට ඉවත් කරගෙන තිබුණු නමුත්, පාසැල් සංවර්ධන අරමුදලට ලබාදී නොතිබුණි. | පාසැලට අනුබද්ධව ඇති කරගනු ලබන සංගම් විසින් පවත්නා නීත්‍යානුකූල තත්ත්වයන්ට යටත්ව කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන ආකාරයෙන් කටයුතු කිරීමට ඉදිරි පියවර ගන්නා ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව. |
| (ආ) පාසැල් පද්ධතියේ ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා භාවිතා කරනු ලබන වත්කම් වර්ග 4 ක අයිතම 206 ක් ඌණ උපයෝජිතව හා වත්කම් වර්ග 07 ක අයිතම් 141 ක් උපයෝජනය නොකර පැවතුණි. | ඌණ උපයෝජිත භාණ්ඩ හඳුනාගෙන අවශ්‍යතාවය සහිත වෙනත් පාසැලකට මුදා හැරීමට හෝ ඌණ උපයෝජනය වීමට හේතු වූ කරුණ හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදීමටත්, නව තාක්ෂණ දැනුම ලබාගැනීමට පරිගණක යථා තත්ත්වයට පත්කිරීම සඳහා කාල ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීමටත් පියවර ගත යුතු වීම. | ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දී ඇති බව. |
| (ඇ) 2008 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අංක අමප/08/1742/316/086 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබුණද, ඊට අදාළ කෙටුම්පත් පනත 2008 ඔක්තෝබර් 29 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පනතේ කටයුතු අවසන් කර නොතිබුණි. එසේ වුවද, 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවට ඒකාබද්ධ අරමුදලින් ලබාදී තිබුණු රු. 42,184,462 ක් වැයකර තිබුණද, කොමිෂන් සභාවේ කාර්යසාධනය සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව සම්බන්ධව කෙටුම්පත් කරන ලද පනතේ කටයුතු අවසන් කිරීම සඳහා කටයුතු කළයුතු වීම. | මෙම කාර්යය කඩිනම් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීමක් 2020 මාර්තු මස සිදුකර ඇති බව. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා යුනෙස්කෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම හා ගෙවීම් කිරීම මෙම පනතට අනුව සිදුකල යුතු නමුත්, පනත අනුමතව නොතිබියදී, 2008 සැප්තැම්බර් මස 24 දිනැති අංක අමප/08/1742/316/086 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාවට කාර්ය මණ්ඩලයක් පත් කර ගෙවීම් සිදුකර තිබුණි. තවද, ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය වෙත සම්බන්ධීකරණ නිලධාරිනියක අනුයුක්ත කර ඇයගේ පාරිශ්‍රමික වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු. මිලියන 45.85 ක ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. | පනත සම්මත කර එහි ඇතුළත් ආකාරයට කටයුතු කළයුතුය. | ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභා ව්‍යවස්ථා මාලාවේ බලතල හා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව එසේ සිදුකර ඇති බව. |
| (ඉ) 2019 මැයි මාසයේ චීනයේ පවත්වා තිබුණු සම්මන්ත්‍රණයක් සඳහා අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියකු සහභාගී කරවා ඒ සඳහා රු. 563,443 ක වියදමක් දරා තිබුණද, 2019 දෙසැම්බර් මාසයේ සිට එම නිලධාරියා තනතුර හැර ගොස් තිබුණි. | විදේශ හා දේශිය පුහුණු වැඩසටහන් හෝ සම්මන්ත්‍රණ තුලින් ලබාගන්නා දැනුම ඵලදායී ලෙස ආයතනයේ කාර්යසාධනය වැඩිකර ගැනීම සඳහා යෙදවිය යුතු වීම. | මෙම විෂයය පිළිබඳ මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුල ව්‍යාපෘති කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන එසේ සිදුකර ඇති බව. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු. මිලියන 10,031 ප්‍රසම්පාදනයන් සිදුකිරීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. මිලියන 25.5 ක් වටිනා ප්‍රසම්පාදනයන් පමණක් අවසන් කර තිබුණු අතර, වටිනාකම රු.මිලියන 272.82 ප්‍රසම්පාදන කාර්යයන්ට අදාළ ලංසු ලියවිලි සකස් කිරීම හා ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ ආරම්භක අවස්ථාවේ පැවතුණි. එසේම 2019 පෙබරවාරි වන විට අවසන් කළයුතු රු.මිලියන 15 ක අ.පො.ස. උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදී විෂය උපකරණ මිලදී ගැනීමේ කාර්යය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලංසු ඇගයීමේ අවස්ථාවේ පැවතුණු අතර, රු. මිලියන 173.74 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 12 ක් අවලංගු කර තිබුණි. | වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් සැලසුම් කරන ලද ආකාරයට අදාල නිශ්චිත කාල වකවානු තුලදීම නිමා කරමින් අපේක්ෂිත භෞතික ප්‍රගතිය හා ඵලදායිත්වය ලඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වීම. | විවිධ හේතු මත එසේ සිදුවී ඇති බවත් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් දී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට (GEM ව්‍යාපෘතිය) අදාළව රු. මිලියන 144.12 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 19 ක් සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කර තිබුණු නමුත්, වර්ෂය අවසන් වන විට ඉන් සිදුකර තිබුණේ රු. මිලියන 0.71 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 2 ක් පමණි. | -එම- | අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. |
| (ඇ) | පාස්කු ප්‍රහාරය හේතුවෙන් අත්‍යාවශ්‍ය කටයුත්තක් ලෙස සලකා සිදුකර තිබු නුගේගොඩ අනුලා විද්‍යාලේ රු. 1,016,000 ක වටිනා ආරක්ෂිත වැට ඉදි කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2013 අප්‍රේල් 19 දිනැති අංක 01/2013 දරන චක්‍රලේඛයේ හා 2015 ජනවාරි 29 දිනැති අංක 05/2105 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, ඊට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුක්තව සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදව සිදු කිරීමට හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතු වීම. | උද්ගතව පැවති අනතුරුදායක තත්ත්වය මත කඩිනමින් ඉටුකළ යුතුව තිබුණු බැවින්, ඒ අනුව කටයුතු කර ඇති බව. |
| (ඈ) | වටිනාකම රු. 4,479,000 වැයකර වසරක වගකීම් කාලයක් සහිතව 2017 ඔක්තෝබර් මාසයේදී සවිකර තිබුණු අමාත්‍යාංශයේ හතරවන මහල දක්වා ක්‍රියාත්මකව පවතින විදුලි සෝපානය වගකීම් කාලයෙන් පසු නිතර ක්‍රියාවිරහිත වන තත්ත්වයක් පැවතුණි. 2019 වර්ෂයේ අඛණ්ඩව දින 40 ක් ක්‍රියාවිරහිතව තිබුණු අතර, අළුත්වැඩියාව සඳහා රු. 292,602 ක් වැයකර තිබුණි. | මෙම විදුලි සෝපානය නිලධාරීන්ගේ භාවිතය සඳහා අවහිරයකින් තොරව ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | වගකීම් කාලය වසර එකක් පමණක් වන බැවින්, අදාළ මුදල ගෙවා සෝපානය යථා තත්ත්වයට පත් කරගැනීමට සිදුවූ බවත්, වගකීම් කාලයෙන් පසුව දොර අශ්‍රිතව පැන නැඟී තිබුණු බිඳවැටීම් 8 ක් වාර්තා වී තිබුණු බව. |
| (ඉ) | ඉදිකිරීම් නිම කළයුතු කාලය අවසන් වී තිබුණු ජාතික පාසැල් 25 ක ගොඩනැගිලි 45 ක ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අවසන් වී නොතිබුණු අතර, 2013 වර්ෂයේ සිට පැවතෙන මෙම ප්‍රමාද වූ ඉදිකිරීම්වල කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ ගොඩනැගිලි 27 ක් ජාතික පාසැල් 17 ක තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම්වල ප්‍රමාදය අවම කිරීමට පියවර ගතයුතු අතර, එම පහසුකම් සිසු පරිහරණය සඳහා කඩිනමින් ලබාදීමට කටයුතු සැලසිය යුතු වීම. | ඉදිරි පියවර ගැනීමට යොමුකර ඇති බව. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික පාසැල් 373 න් 278 ක පැවතුණු ස්ථිර විදුහල්පති තනතුරු පුරප්පාඩු සඳහා 2020 පෙබරවාරි මාසයේදී ස්ථිර විදුහල්පතිවරුන් 153 දෙනෙක් පමණක් පත්කර තිබුණි. | වසර ගණනාවක සිටම පවතින විදුහල්පති පුරප්පාඩු පිරවීමට නිශ්චිත හා සාධාරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. | ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ආ) | 2016 මැයි 16 දිනැති අංක 17/2016 දරන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3.1 ඡේදයට පටහැනිව 2017 වර්ෂයේදී ජාතික පාසැල් 109 ක් සඳහා සිසුන් 6,337 ක්, 2018 වර්ෂයේදී පාසැල් 73 ක් සඳහා සිසුන් 3,339 ක් හා 2019 වර්ෂයේදී පාසැල් 81 ක් සඳහා සිසුන් 6,366 ක් වශයෙන් සිසුන් ඇතුලත් කර තිබුණි. | පවතින පහසුකම් පිළිබඳව අවධානය යොමු නොකරමින් චක්‍රලේඛ සීමාවන් ඉක්මවා අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම අවම කිරීම සඳහා පියවර ගතයුතු වීම. | අධ්‍යාපන අමාත්‍යතුමාගේ විශේෂ අනුමැතින් මත සිසුන් ඇතුළත් කිරීමට සිදුවන බව. |
| (ඇ) | විභාග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව, 2019 වර්ෂයේ උසස් පෙළ විභාගයේ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, තාක්ෂණය සඳහා විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, භූගෝලය, දේශපාලන විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉංග්‍රීසි හා සාමාන්‍ය ඉංග්‍රීසි යනාදී විෂයයන් හැදෑරූ සිසුන්ගෙන් සියයට 30 කට ආසන්න ප්‍රමාණයක් අසමත්ව තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී සියළුම විෂය ධාරාවලින් විෂයයන් තුනම අසමත් සිසුන් සංඛ්‍යාව 23,404 ක් වූ අතර, ඉකුත් වර්ෂවල සිට පැවත එන මෙම ප්‍රතිඵල අවම වීමට හේතුවූ කරුණු හඳුනාගැනීමට සහ ඒ සඳහා පිළියම් යෙදීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමස්ථ ප්‍රතිඵල ඇගයීම තුලින් හා නිසි අධ්‍යයනයකින් පසුව අධ්‍යාපන ව්‍යුහය තුල පවතින අඩුපාඩු හඳුනාගෙන අවශ්‍ය පිළියම් යෙදිය යුතු වීම. | අදාළ කරුණු පිළිබඳව සොයා බලා පිළියම් යෙදීමට අදාළ නිලධාරීන් සටහන් කරගෙන ඇති බව. |
| (ඈ) | ජාතික පාසැල් 125 ක සියළුම ධාරාවලින් 2019 වර්ෂයේදී උසස් පෙළ සඳහා පෙනී සිටි සිසුන්ගෙන් 2,519 ක් සියළුම විෂයයන් අසමත් වී තිබුණි. එම අසමත් වීම විෂය ධාරා අනුව පිළිවෙලින් ජීව විද්‍යාව 617 ක්, ගණිතය 848 ක්, වාණිජ 342 ක් කලා 336 ක් හා තාක්ෂණවේදය 376 ක් වී තිබුණු අතර, සිසුන් අසමත් වීම | සිසුන් හදාරන විෂයයන් පිළිබඳව ඔවුන්ට ඇති හැකියාව හා ප්‍රගුණත්වය, ගුරුභවතුන් එම විෂයයන් සම්බන්ධයෙන් ලබාදෙන දැනුම, විභාග ප්‍රශ්න පත්‍ර ආදී කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් | ක්ෂේත්‍රයේ පවතින පොදු බලපෑම්වලට අමතරව ගුරු හිඟය, විද්‍යාගාර හිඟය, පුහුණු ගුරුවරුන් සේවයෙන් ඉවත්වීම වැනි කරුණු විෂය ප්‍රතිඵල අඩුවීමට බලපා ඇති බවත් ඒ සඳහා වූ උපාය මාර්ග ඉහළ මට්ටමකට ගෙන ඒමට |

| | | | |
|---|---|---|---|
| | අවම කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | සිසුන්ගේ අසමත්වීම් අවම කිරීම සඳහා කටයුතු කළයුතු වීම. | අපේක්‍ෂා කරන බව. |
| (ඉ) | 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ ප්‍රකාරව 2019 මැයි 19 දිනට ජාතික පාසැල්වල අතරමැදි ශ්‍රේණිවල පැවති පුරප්පාඩු සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට 2019 වර්ෂයේදී පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. පුරප්පාඩු නොපවතින පාසල් 11 කටද සිසුන් ඇතුළත් කර තිබුණු අතර, හොරණ තක්‍ෂිලා විද්‍යාලයේ පුරප්පාඩු නොමැති බව සඳහන් කර තිබුණද සත්‍ය වශයෙන් පුරප්පාඩු 124 ක් පැවතුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව හා පවතින නෛතික ක්‍රමවේදයන් තුළ කටයුතු කළයුතු වීම. | ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට විසඳා අවසන් නොවූ විනය ගැටළු 479 ක් පැවතිණි. | විනය ගැටළු කඩිනමින් විසඳීමට කටයුතු කළයුතු වීම. | කඩිනමින් විසඳීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බව. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්‍ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධාරී පුරප්පාඩු 2,276 ක් පැවතීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදීද, තෘතීයික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 3,235 ක් පැවතීම හේතුවෙන් අමාත්‍යාංශ කටයුතු වලටද අවහිරතා මතුවී තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වීම. | මේ සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. |
| (ආ) | ජාතික පාසැල් 143 ක විෂයයන් 1,490 ක් වෙනුවෙන් ගුරු ඌණතාවයන් 1, 859ක් හා විෂයයන් 787 ක් වෙනුවෙන් ගුරු අතිරික්තතාවයන් 1,202 ක් පැවතුණි. දෙවන භාෂාවක් ලෙස දෙමළ හෝ සිංහල ඉගැන්වීම සඳහා ජාතික පාසැල් 36 ක බාහිරින් බඳවාගත් ගුරුභවතුන් 48 දෙනෙක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 6,012,225 ක් ගෙවා තිබුණි. | ජාතික පාසැල්වල පවතින ගුරු ඌණතා සහ අතිරික්තතා අවම කිරීම තුලින් පාසැල්වල පවතින ගුරු අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම. | 2020 වර්ෂයේ සිට විෂයයන් අනුව ගලපා ගුරු ඌණතා හා අතිරික්තතා තුලනය කිරීමට කටයුතු කරන බව |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික පාසැල් 135ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 1,619ක ඌණතාවයක් හා 403ක අතිරික්තයක් පැවතුණු අතර, ජාතික පාසැල් 30ක පාසැල් සංවර්ධන සමිතියෙන් වැටුප් ගෙවමින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 134 දෙනෙකු බඳවාගෙන තිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේදී පමණක් ඔවුන් වෙත ගෙවා තිබුණු මුළු මුදල රු.21,932,019 ක් විය. | ප්‍රමාණවත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීමටත් ඔවුන්ගේ කාර්යභාරය උපරිමව පාසැල වෙත ලබාගැනීමටත් කටයුතු කළයුතු වීම. | කාර්යමණ්ඩල ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අවස්ථාවල එසේ කිරීමට සිදුවී ඇති බව. |
| (ඈ) | අනාගත හා නවීන අධ්‍යාපන ක්‍රම වේද අනුව පූර්ව සේවා ගුරු පුහුණුව ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් විද්‍යාපීඨ 19 ක් තුළ අධ්‍යයන කාර්ය මණ්ඩල 209 ක් අනධ්‍යයන කාර්ය මණ්ඩල 167 ක පුරප්පාඩු පැවතුණි. තවද, විධිමත් ස්ථානමාරු ප්‍රතිපත්තියක් නොතිබීම හේතුවෙන් විද්‍යාපීඨ 14 ක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 190 දෙනෙකු හා විද්‍යාපීඨ 15 ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 240 දෙනෙකු ස්ථානමාරු නොලබා වසර 08 කට වැඩි කාලයක් සේවයේ යෙදී තිබුණි. | අනාගත අභියෝග ජය ගැනීමට මනා නිපුණතාවක් ඇති ගුරු පිරිසක් බිහිකිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් ලබාදිය යුතු වීම.<br>විධිමත් ස්ථානමාරු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගතයුතු වීම. | ඒ සඳහා ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.<br>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සඳහා මෙතෙක් වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තියක් නොතිබුණු බවත්, මේ වන විට වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තියක් සකස් කර 2020 සිට එය ක්‍රියාත්මක කිරීමට නියමිත බව. |
| (ඉ) | විගණනයට ඉදිරිපත් කරන ලද කලාප 8 ක තොරතුරු අනුව 2004 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා වර්තමාන වැටුප් පියවරෙහි පිහිටුවා නොතිබුණු විදුහල්පතිවරු හා ගුරුභවතුන් සංඛ්‍යාව 6,695 ක් විය. | වර්තමාන වැටුප් පියවරෙහි පිහිටුවා නොතිබීම හේතුවෙන් සිදුව ඇති වරද නිවැරදි කළ යුතු වීම. | තොරතුරු කැඳවා ඇති බවත් කඩිනමින් පිළිතුරු සපයන බව. |
| (ඊ) | 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පවත්වාගෙන යන තොරතුරු අනුව පළාත් 9 හි ජාතික පාසැල්වල සහ පිරිවෙන්වල ගුරුභවතුන් වෙත ගෙවිය යුතුව ඇති හිඟ වැටුප්වල එකතුව රු. 411,382, 945 ක් වූ අතර, පළාත් කාර්යාලවල පවත්වාගෙන යන තොරතුරු අනුව පළාත් 9 හි අනෙකුත් පාසැල්වල ගුරුභවතුන් වෙත ගෙවිය යුතුව පවතින සියළු ගුරු වැටුප්වල එකතුව රු. 828,704,012 ක් විය. | හිඟ වැටුප් ගෙවීමට කටයුතු කළයුතු වීම. | -එම- |